# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2007

## ඉතිහාසය - HIST-E1015

### පැරණි ශිෂ්ටාචාර

<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි                                   කාලය : පැය 03 යි

---

01. 'ශිෂ්ටාචාරය' යනු කුමක්දැයි නිර්වචනය කොට චීන ශිෂ්ටාචාරය බිහිවීමට හා වර්ධනයවීමට තුඩු දුන් ප්‍රධාන සාධක පරීක්ෂා කරන්න.

02. ෂං රාජවංශ සමය තුළ චීනයේ පැවති සංස්කෘතියේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න.

03. සුමේරියානු ශිෂ්ටාචාරය බිහිවීමෙහි ලා භූගෝලීය සාධකවල බලපෑම කෙබඳුදැයි පරීක්ෂා කරන්න.

04. ඓතිහාසික මූලාශ්‍රයක් වශයෙන් හමුරාබි නීති සංග්‍රහයෙහි ඇති වැදගත්කම පරීක්ෂා කරන්න.

05. පැරණි ඊජිප්තුවේ දේශපාලන වර්ධනයෙහි ප්‍රධාන අවස්ථා ගෙනහැර දක්වන්න.

06. මමීකරණය යන්නෙන් කුමක් අදහස් වන්නේදැයි සැකෙවින් පැහැදිලි කොට මමීකරණය හා පිරමිඩ තැනීම පිළිබඳව ඊජිප්තුවේ පැවති විශ්වාස ගැන විස්තරයක් කරන්න.

07. පැරණි ග්‍රීකයන් අතර පැවති පෞර රාජ්‍ය ක්‍රමය කෙටියෙන් විස්තර කොට එම පෞර රාජ්‍යවල පැවති විවිධ ආණ්ඩුක්‍රම විග්‍රහ කරන්න.

08. සාහිත්‍යය හා දර්ශනය යන ක්ෂේත්‍රවල පැරණි ග්‍රීකයන්ගේ කාර්ය සාඵල්‍යය සැකෙවින් සමාලෝචනය කරන්න.

09. ක්‍රි. ව. පළමුවන සියවස අවසානය තෙක් රෝම බලව්‍යාප්තියේ ප්‍රධාන අවස්ථා ගෙනහැර දක්වන්න.

10. ක්‍රිස්තියානි ආගම රෝම අධිරාජ්‍යය තුළ ව්‍යාප්ත වූ අයුරු පැහැදිලි කරන්න.

***************************